කොළඹ දිසා අධිකරණයේදීය.

නිහාල් ශ්‍රී අමරසේකර,
අංක.167/4, ශ්‍රී විපුලසේන මාවත,
කොළඹ - 10.

<u>පැමිණිලිකරු</u>

නඩු අංකය :- 19849/එම්.ආර්.

එදිරිව

ගාමිණි ලක්ෂ්මන් පීරිස්,
"විසුම්පාය", ස්ටේපල්ස් වීදිය,
කොළඹ - 2.
<u>සහ</u> අංක.37, කිරුළ පෙදෙස,
කොළඹ - 5.

<u>විත්තිකරු</u>

මෙම අධිකරණයේ 98/07/30 දින දරණ නියෝගය, අභියාචනාධිකරණය විසින්, ප්‍රතිශෝධන ඉල්ලීම් අංක.සීඒ 775/98 දරණ නඩුවේදී 1999/02/11 වන දින ඉවත දැමීමට සහ අනතුරුව අංක.සීඒ/එල්ඒ/192/98 දරණ නඩුවේදී, <u>1998/07/30 වන දින දරණ නියෝගය දැනටමත් හිස්කොට ඉවත දමා ඇති බැවින්, සමාලෝචනය කිරීම පිණිස තවදුරටත් කිසිවක් ඉතිරිව නැති බව</u> 1999/04/27 වන දින කරන ලද නියෝගය මගින් ස්ථිර කරන ලද හෙයින් ද,

1999/04/27 දින අභියාචනාධිකරණයේ එකී නියෝගයේ සහතික කළ පිටපතේ සහ අභියාචනාධිකරණයේ 1999/02/11 වන දින නියෝගයේ සහතික කළ පිටපතේ සත්‍ය පිටපතක් ද, පිළිවෙලින් **'ඒ' සහ 'බී'** යනුවෙන් ලකුණු කොට මෙයට අමුණා ඇත.

ඉහත කී හේතුව නිසා, කට උත්තර පරීක්ෂණයක් මගින් හෝ දිවුරුම් ප්‍රකාශයක් මගින් විචාරණ වලට උත්තර දෙන ලෙස විත්තිකරුට නියම කරන ලෙස සිවිල් නඩු විධාන සංග්‍රහයේ 100 වන වගන්තිය යටතේ නියෝගයක් කරන ලෙස එම වගන්තිය යටතේ පැමිණිලිකරු විසින් කරන ලද 1998/03/11 වන දින දරණ ඉල්ලීම වලංගු කර සහ මෙම අධිකරණය ඉදිරියේ නිම නොවී පවතින හෙයින් ද,

සිවිල් නඩු විධාන සංග්‍රහයේ 94 වන හා 95 වන වගන්ති යටතේ විචාරණ විත්තිකරු වෙත භාරදීමෙන් පසු <u>සිවිල් නඩු විධාන සංග්‍රහයේ 99 වන වගන්තිය යටතේ නියම කර ඇති පරිදි දිවුරුම් ප්‍රකාශයක් ගොනු කිරීමට සහ එකී විචාරණ වලට උත්තර දීමට හෝ සිවිල් නඩු විධාන සංග්‍රහයේ 98 වන වගන්තියේ නියමයන් අනුව යම් විචාරණයකට උත්තරදීම ප්‍රතික්ෂේප කිරීම සඳහා හේතු නිශ්චිතව සඳහන් කිරීමට විත්තිකරු පැහැරහැර ඇති</u> හෙයින් ද,

විත්තිකරු/

විත්තිකරු වෙත මෙම අධිකරණය විසින් භාරදෙන ලද එකී විමසුම් වලට උත්තර දීමට සිවිල් නඩු විධාන සංග්‍රහයේ 100 වන වගන්තියේ නියමයන් අනුව විත්තිකරු දැන් බන්ධනය වී සිටින හෙයින් ද,

සිවිල් නඩු විධාන සංග්‍රහයේ 100 වන වගන්තියේ නියමයන් අනුව, කට උත්තර පරීක්ෂණයක් මගින් හෝ දිවුරුම් ප්‍රකාශයක් මගින්, ගරු කටයුතු ඔබතුමාගේ අධිකරණය විසින් නියම කරනු ලබන දිනයක එකී විමසුම් වලට උත්තර දීමට විත්තිකරුට විධාන කරන ලෙස අපි ඔබතුමාගේ ගරු අධිකරණයෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිමි.

වර්ෂ 1999 ක්වූ මැයි මස 12 වන දින කොළඹදීය.

පැමිණිලිකරුගේ නීතිඥ.

මෙම මෝසමේ පිටපතක් සහ ඊට
අමුණා ඇති ඇමුණුම්ද, ලියාපදිංචිකළ
තැපෑලෙන් විත්තිකරුගේ නීතිඥවරුන් වෙත
යවන ලදුව, ඊට සාක්ෂි වශයෙන් අදාළ
තැපැල් භාණ්ඩ ලියාපදිංචිකිරීමේ රිසිට්පත
මෙයට අමුණා ඇත.

පැමිණිලිකරුගේ නීතිඥ.